| | | |
|---|---|---|
| මෙහි රාජ්‍ය ලාංඡනය යොදන්න | **අධිකරණ,රාජ්‍ය පරිපාලන,ස්වදේශීය කටයුතු,පළාත් සභා,පළාත් පාලන සහ කම්කරු අමාත්‍යාංශය**<br>**ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය** | |

**කාර්යාලීය ගොඩනැගිලි බදු කුලී පදනමින් ලබා ගැනීම සඳහා**
**මිලගණන් කැඳවීම - උතුරු මැද පළාත් කාර්යාලය**

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ උතුරු මැද පළාත් කාර්යාලය පවත්වා ගෙන යාම සඳහා අනුරාධපුර නගරයට ආසන්නව පිහිටි, වර්ග අඩි 3000-3500 අතර ඉඩකඩ පහසුකම් වලින් යුත් කාර්යාලයකට සුදුසු ගොඩනැගිල්ලක් බදු පදනම/කුලී පදනම මත ලබා ගැනීම සඳහා මිල ගණන් කැඳවනු ලැබේ.

**ගොඩනැගිලි සම්බන්ධයෙන් සපුරාලිය යුතු සුදුසුකම්**

- මෙම ගොඩනැගිල්ල මාසික බදු පදනම මත ලබා දිය යුතුය.
- මෙම ගොඩනැගිල්ල පොදු ප්‍රවාහන පහසුකම් භාවිතා කර පහසුවෙන් ලඟා විය හැකි වාණිජමය ප්‍රදේශයක් තුල පිහිටිය යුතු අතර වාණිජමය භාවිතය සඳහා ඉදිකරන ලද්දක් විය යුතුය .
- අවම වශයෙන් වාහන 05ක් පමණ ගාල් කිරීමට ඉඩ පහසුකම් තිබිය යුතුය.
- තෙකලා විදුලි සැපයුමක් සමඟ වෙන්වූ විදුලි මීටරයක් තිබිය යුතු අතර. විදුලිය විසන්ධි වූ අවස්ථාවක භාවිතා කිරීමට විදුලි ජනක යන්ත්‍රයක් තිබීම අමතර සුදුසුකමක් වේ.
- ඍජු ජල නල සම්බන්ධතාවයක් සමඟ වෙන්වූ ජල මීටරයක් තිබිය යුතු අතර ගොඩනැගිල්ලට ජලය 2000L පමණ ගබඩා කර තැබිය හැකි ජල ටැංකියක්/ටැංකිවලින් සමන්විය යුතුය.
- ස්ථාවර දුරකථන පහසුකම් තිබිය යුතුය.
- ප්‍රධාන විදුලිය බෙදාහැරීමේ පුවරුව සහිත මූලික විදුලි පරිපථ පද්ධතිය විදුලි පංකා හා අනෙකුත් උපාංගවලින් සමන්විය යුතුය.
- ස්ථානය තෝරාගත් බව දැනුම් දීමෙන් පසු ගොඩනැගිල්ල සම්පූර්ණයෙන්ම වැඩ නිමකර සති 2ක් ඇතුලත ලබා ගැනීමේ හැකියාව පැවතිය යුතුය.
- සේවා ලබා ගැනීමට පැමිණෙන සේවාලාභීන් 10කට පමණ එකවර අසුන් ගෙන තම රාජකාරී සේවාව ඉටු කර ගැනීම සඳහා ඉඩ පහසුකම් ගොඩනැගිල්ල ඇතුලත තිබිය යුතුය.
- එක් වරකට ආසන්න වශයෙන් පුහුණුලාභීන් 30ක් සඳහා පන්ති පැවැත්විය හැකි වර්ග අඩි 400 පමණ ප්‍රමාණයේ දේශන ශාලා 02ක් තිබිය යුතුය.
- අප ජලය හා මල අපවහන ක්‍රමවේදය විධිමත් පරිදි සකස් කල ගොඩනැගිල්ලක් විය යුතුය.
- කාර්ය මණ්ඩලයට හා බාහිර පාර්ශවයන්ට භාවිතා කිරීම සඳහා වැසිකිලි 06 ක් පමණ වෙන් වෙන්ව තිබිය යුතුය.
- කාමර කොටස් කර ගැනීම, විදුලි පරිපථ හා පරිඝණක ජාල ගත කරන කටයුතු කාර්යාංශයට අවශ්‍ය පරිදි සිදු කර ගත හැකි විය යුතුය.
- කාර්යාලය පවත්වා ගෙන යාම නිසා අදාළ ගොඩනැගිල්ල පිහිටි ප්‍රදේශය අවට පදිංචිකරුවන්ට කිසිදු අවහිරතායක් නොවන ස්ථානයක් විය යුතුය.
- වායු සමීකරණ පද්ධතියක් සවිකර තිබීම අමතර සුදුසුකමකි.
- නිළධාරීන් සඳහා නේවාසික පහසුකම් ලබාගතහැකි අයුරින් වෙන්වූ කාමර දෙකක් හෝ කීපයක් වැසිකිලි පහසුකම් සහිතව ගොඩනැගිලි තුල පිහිටීම හා ඒ සඳහා වෙන්වූ ඇතුල්වීමේ දොරටුවක් තිබීම හෝ මෙම පරිශ්‍රයේම මේ සඳහා ගොඩනැගිල්ලක් පිහිටීම අමතර සුදුසුකමක් වේ.
- බදු දීමනාකරු විසින් සඳහන් කර ඇති මාසික කුලී මුදල රජයේ තක්සේරු වාර්තාවට යටත්ව ගෙවීම් සිදු කරනු ලබයි. (අවම මුදල)

**ගොඩනැගිලි හිමිකරු විසින් මෙහි සඳහන් ලියකියවිලි වල පිටපත් ඉදිරිපත් කල යුතුය**.

1. මිල ගණන් පත සමඟ කාර්යංශය ලබා දෙන ලංසු ලේඛණය
2. මාසික බදු මුදල සඳහන් ලිපියක්
3. බද්දට අදාළ දේපළේ නිශ්චිත ලිපිනය.
4. ගොඩනැගිලි හිමිකරු අයිතිවාසිකම් ලබාගත් ඔප්පුවෙහි සහතික කරන ලද පිටපතක් හා ඊට අදාළ පත්ඉරු.
5. දේපළට අදාළ පිඹුරුපත.
6. සහතික කරන ලද අනුමත ගොඩනැගිලි සැලැස්ම (අදාළ ගොඩනැගිලි සැලැස්ම A4 ප්‍රමාණයේ හෝ A3

ප්‍රමාණයන්ට කුඩා කර ලබාගත් ඡායාපිටපතක් විය යුතුය).

7. බදු දීමනාකරුගේ නම/ලිපිනය/ජාතික හැඳුනුම්පත් අංකය හා එහි පැහැදිලි ඡායා පිටපතක්.
8. ගොඩනැගිලි හිමිකරුගේ දුරකතන අංකය.
9. අනුකූලතා සහතිකය
10. පසුගිය මාස 06 ඇතුලත ලබාගත් විදුලි, දුරකතන,වරිපනම් ආදී බිල්පත් වල පිටපත්
11. බදු දීමට අපේක්ෂිත දේපළ සම්බන්ධව පුද්ගලික අයිතියක් පමණක් නොපෙන්වන අවස්ථාවලදී , එනම් අදාළ දේපළෙහි පරම අයිතිකරු ශ්‍රී ලංකා ජනරජය වන අවස්ථාවන්හිදී (ස්වර්ණභූමි/ජයභූමි/ප්‍රදාන පත්‍ර/30 අවුරුදු බදු පදනම මත ලබා දී ඇති ඉඩම් ආදී) අදාළ ප්‍රාදේශීය ලේකම්ගේ අවසරය සහිත ලිපියක් සමඟ ඉදිරිපත් කිරීම අත්‍යවශ්‍ය වේ.
12. මේ සම්බන්ධව පහත සඳහන් දුරකථන අංක ඔස්සේ පමණක් පැහැදිලි කර ගැනීම් සිදු කර ගන්නා ලෙසත්, අතරමැදියන් හෝ වෙනත් කිසිදු නිලධාරියෙකු ,බාහිර පාර්ශවයක් සමඟ එකඟතාවයන් ඇති කර ගැනීම මෙම ලංසුව ප්‍රතික්ෂේප වීමට හේතු වේ.

ලංසුපත් බත්තරමුල්ල, කොස්වත්ත, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක.234 හි ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ දෙවන මහලෙහි පිහිටි ප්‍රසම්පාදන අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට 2024.10.29 .දින පෙ.ව 11.00 ට හෝ ඊට පෙර බහාලිය යුතුය. ඔබගේ ඉල්ලුම්පත බහාලන කවරයේ වම් කෙලවරේ ඉහළින් **"ගොඩනැගිලි කුලී පදනම මත/බදු පදනමට යටත්ව ප්‍රසම්පාදනය කිරීම - අනුරාධපුරය. PR/02/04-1(80)** යනුවෙන් සඳහන් කළ යුතුය.

කිසියම් අයදුම් පත්‍රයක් ප්‍රතික්ෂේප කිරීමේ හෝ භාර ගැනීමේ අයිතිය කාර්යාංශයේ ප්‍රසම්පාදන කමිටුව සතු වන අතර, ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසාන තීරණය වේ. **රජයේ තක්සේරු කරුගේ වාර්තා වලට යටත්ව තෝරා ගැනීම් සිදු කරණු ලැබේ.** ආපසු නොගෙවන රුපියල් 1000.00 ක මුදලක් ලංකා බැංකුව 0000001650 කාර්යාංශ ගිණුමෙහි තැන්පත් කර රිසිට් පත ඉදිරිපත් කර අංක 29, වාන්ඇල නිවාස,අනුරාධපුර ලිපිනයන් පිහිටි විදේශ සේවා නියුක්ති කාර්යාංශ ශාඛා කාර්යාලය මගින් 2024.10.07 දින සිට 2024.10.28 දින දක්වා කාර්යාලීය වේලාව තුලදී ලංසු ලේඛණ ලබා ගත හැක.

සභාපති - දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව
ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය,
අංක.234, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
කොස්වත්ත, බත්තරමුල්ල.
දුරකථන/ෆැක්ස්:2880550/2887585
වෙබ් අඩවිය:www.slbfe.lk

**එතෙර සවියට මෙතෙර අත්වැල**